# 12. පච්චවෙක්ඛණා

## ද්වාදසමො පාඨො



(1) පටිසඞ්ඛායොනිසො චීවරං පටිසෙවාමි, යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය යාවදෙව හිරිකොපීන පටිච්ඡාදනත්ථං.

(2) පටිසඞ්ඛායොනිසො පිණ්ඩපාතං පටිසෙවාමි, නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරොචාති.

(3) පටිසඞ්ඛායොනිසො සෙනාසනං පටිසෙවාමි, යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං.

(4) පටිසඞ්ඛාය යොනිසො ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවාමි, යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වේදනානං පටිඝාතාය, අබ්‍යාපජ්ඣපරමතායාති.

## වචන මාලාව

1. පටිසඞ්ඛාය - මෙනෙහි කොට
2. යොනිසො - සිහිනුවණින්
3. පටිසෙවාමි - පරිහරණය කරමි
4. යාවදෙව - යම්තාක්
5. සීත - සීතල
6. පටිඝාත - නැසීම
7. උණ්හ - උෂ්ණය
8. ඩංස - ඇට මැස්සා (ඩැහැ ලේ බොන)
9. මකස - මදුරුවා
10. වාත - වාතය
11. ආතප - අව්ව
12. සිරිංසප - සර්පයා
13. සම්ඵස්ස - ස්පර්ශය
14. හිරිකොපීන - ලජ්ජා ඇතිවන තැන
15. පටිච්ඡාදන - වැසීම
16. දව - ක්‍රීඩාව
17. මද - මදය
18. මණ්ඩන - අලංකාරය
19. විභූසන - සැරසීම
20. ඨිති - පැවැත්ම
21. යාපන - යැපීම
22. විහිංසූපරති - බඩගිනි නැසීම
23. උතුපරිස්සය - ඍතුපීඩා
24. ඉති - මෙසේ
25. පටිසල්ලානාරාම - සිත එකඟකිරීමේ ඇලීම
26. වෙය්‍යාබාධික - විවිධ ආබාධ
27. උප්පාදෙස්සාමි - උපදවන්නෙමි
28. යාත්‍රා - ඉරියව් පැවැත්ම
29. ච - ද
30. අනවජ්ජ - නිවැරැදි
31. ඵාසුවිහාර - පහසු විහරණය
32. භවිස්සති - වන්නේ ය
33. අබ්‍යාපජ්ඣ - නිරෝගීබව/පීඩාරහිත බව
34. පරමතාය -උසස් කොට ඇති
35. සාධුකං - මනා කොට

## අනාගත කාලයේ ක්‍රියා පද සෑදීම

වර්තමාන කාලයේ ක්‍රියාපද පිළිබඳ අපි මුල දී උගත්තෙමු. අනාගත කාලයේ ක්‍රියාපද සැකසීමේ දී භාවිත වන ප්‍රත්‍යය සයක් (6) ක් තිබේ. ඒ මෙසේ ය.

**අනාගත කාල භවිස්සන්ති ප්‍රත්‍ය මාලාව**

| පුරිස | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨම පුරිස | ඉස්සති | ඉස්සන්ති |
| මජ්ඣිම පුරිස | ඉස්සසි | ඉස්සථ |
| උත්තම පුරිස | ඉස්සාමි | ඉස්සාම |

- මේ ප්‍රත්‍යය ක්‍රියාපදයක අග දක්නට ලැබේ නම් ඒවා අනාගත කාලයේ ක්‍රියාපද ලෙස හඳුනාගැනීමට පහසු ය.

- මෙම පාඩමේ අප කියවන ලද පාඨයන්හි ***"උප්පාදෙස්සාමි"***, ***"භවිස්සති"*** වශයෙන් ක්‍රියාපද දෙකක් අපට දක්නට ලැබුණි.

- එම පද දෙක අනාගත කාලයේ බව මේ ප්‍රත්‍යය දෙස බැලීමෙන් පෙනේ.

- හාසිස්සති යන ක්‍රියාපදය උදාහරණයක් ලෙස ගෙන ඉතිරි පුරුෂවල ද වරනැගෙන අයුරු බලන්න.

| පුරිස | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨම පුරිස | හාසිස්සති | හාසිස්සන්ති |
| මජ්ඣිම පුරිස | හාසිස්සසි | හාසිස්සථ |
| උත්තම පුරිස | හාසිස්සාමි | හාසිස්සාම |

මෙහි අර්ථය මෙසේ ය.

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | කියන්නේ ය | කියන්නෝ ය |
| මධ්‍යම පුරුෂ | කියන්නෙහි | කියන්නෙහු |
| උත්තම පුරුෂ | කියන්නෙමි | කියන්නෙමු |

අනාගත කාලයේ සරල වාක්‍ය නිර්මාණය කරන අයුරු බලන්න.

උදා:-

01. ඔහු කියන්නේ ය. - සො හාසිස්සති.

02. මිනිස්සු කියන්නෝ ය. - මනුස්සා හාසිස්සන්ති.

03. නුඹ කියන්නෙහි. - ත්වං හාසිස්සසි.

04. නුඹලා කියන්නෙහු. - තුම්හෙ හාසිස්සථ.

05. මම කියන්නෙමි. - අහං හාසිස්සාමි.

06. අපි කියන්නෙමු. - මයං හාසිස්සාම.

## අභ්‍යාසය 12 1

1. පහත සඳහන් වගන්ති සිංහලට නගන්න.
    1. බුද්ධො ධම්මං දෙසෙස්සති.
    2. දෙවා සාධුකං භාසිස්සන්ති.
    3. මනුස්සා කම්මං කරිස්සන්ති.
    4. සො තං පස්සිස්සති.
    5. ත්වං කිං පචිස්සසි?

2. පහත සඳහන් අනාගත කාලික වගන්ති පාලියට නගන්න.
    1. මව දරුවාට කිරි දෙන්නී ය.
    2. මම පාඩම් කරන්නෙමි.
    3. නුඹලා කුමක් කියන්නෙහු ද?
    4. භික්ෂුව ධර්මය දේශනා කරන්නේ ය.
    5. බුදුවරු මතු උපදින්නා හ.

3. නාමපදයක්, කර්මපදයක් හා ක්‍රියාපදයක් නිවැරැදි ව ගළපා අනාගත කාලයෙහි පාලි වාක්‍ය පහක් නිර්මාණය කරන්න.

4. ඔබ කැමති ක්‍රියා පද දෙකක් අනාගත කාලයේ පුරුෂ තුනෙහි වරනගා අර්ථය ලියන්න.

5. පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාව සිංහලට නගන්න.

**මෙම ක්‍රියාපදවල අර්ථ පාඩම් කරන්න.**

1. කිණිස්සති - මිල දී ගන්නේ ය.
2. සුණිස්සති - අසන්නේ ය.
3. පෙසෙස්සති - යවන්නේ ය.
4. වන්දිස්සති - වඳින්නේ ය.
5. නමිස්සති - නමදින්නේ ය.
6. වදිස්සති - කියන්නේ ය.
7. ආහරිස්සති - ගෙන එන්නේ ය.
8. ඡින්දිස්සති - සිඳින්නේ ය.
9. පිබිස්සති - බොන්නේ ය.
10. පචිස්සති - පිසන්නේ ය.
11. ලභිස්සති - ලබන්නේ ය.
12. පතිට්ඨිස්සති - පිහිටන්නේ ය.
13. ජානිස්සති - දැන ගන්නේය.
14. ගණ්හිස්සති - ගන්නේ ය.
15. බන්ධිස්සති - බඳින්නේ ය.
16. අනුබන්ධිස්සති - ලුහු බඳින්නේ ය.
17. චරිස්සති - හැසිරෙන්නේ ය.
18. සරිස්සති - සිහි කරන්නේ ය.
19. රොදිස්සති - හඬන්නේ ය.
20. ඔලොකෙස්සති - බලන්නේ ය.
21. කරිස්සති - කරන්නේ ය.
22. පඨිස්සති - පාඩම් කරන්නේ ය.
23. දෙසෙස්සති - දේශනා කරන්නේ ය.
24. උපපජ්ජිස්සති - උපදින්නේ ය.
25. දදිස්සති - දෙන්නේ ය./දෙන්නී ය.